**පදියතලාව ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පදියතලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී භෞතික තොග නොතිබුණ ද මූල්‍ය ප්‍රකාශනවල රු.114,240 ක තොග වටිනාකමක් දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන යන ලේඛන අනුව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.148,235,567 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.590,505,934 ක් දක්වා තිබීම නිසා ස්ථාවර වත්කම් රු.442,270,367 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුළී රු.176,733 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල 199,233 ක් ලෙස දැක්වීම නිසා ජංගම වත්කම් රු.22,500 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය ගැතියෝ රු.415,556 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.724,873 ක් ලෙස දැක්වීම නිසා ජංගම වත්කම් රු.309,322 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) ප්‍රදේශීය සභා රීති මාලාව | |
| (i) රීති 59 - 66 | සෑම වර්ෂයකම ආරම්භයේදී ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත බදු අය කලයුතු ආයතන හඳුනාගෙන ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) රීති 180 | මුදල්, ගබඩා හා ආදායම එකතු කිරීමේ කටයුතු භාරව ක්‍රියාකරන නිලධාරීන්ගෙන් ලබාගෙන නොතිබුණි. |
| (ආ) ආයතන සංග්‍රහය xxiv වැනි පරිච්ඡේදයේ 8.9.1.1 | නිලධාරියාගේ දීමනා රහිත මාසික වැටුපේ මුළු අඩුකිරීම් සියයට 40 ක සීමාව තුල ණය මුදල නිර්දේශ කල යුතු වුවත්, සේවකයන් 08 දෙනෙකු සඳහා රු.1,214,060 ක ආපදා ණය ලබාදීමේදී එය සැලකිල්ලට ගෙන නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | ධාවන මට්ටමේ පවතින වාහන 05 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,701,241 ක්, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.783,834 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 103 | 134 | 134 | - | 161 | 65 | 65 | - |
| (ii) කුලී | 10,213 | 4,071 | 3,973 | 176 | 3,929 | 2,333 | 2,393 | 79 |
| (iii) බලපත්‍ර ගාස්තු | 634 | 325 | 325 | - | 392 | 378 | 378 | - |
| (iv) වෙනත් ආදායම් | 4,888 | 2,616 | 2,710 | 305 | 4,047 | 2,311 | 2,284 | 399 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.7,626,659 ක් වූ අතර, වර්ෂය තුල රු.7,144,056 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය 93.67 % ක මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.3 කුලී

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.176,733 ක් වූ හිඟ කඩ කුලී ආදායම අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයට පෙර සිට පවතින රු.24,115 ක හිඟහිටි මස් කඩ කුලී අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

### 2.2.4 වෙනත් ආදායම්

2009 අප්‍රේල් 17 දිනැති අංක1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව එක් දූරකථන කුළුණක් සඳහා අනුමැතිය ලබාදීමට අවම වශයෙන් රු.20,000 බැගින් අයකල යුතු වුවද, සභා බල ප්‍රදේශයේ පවතින දූරකථන කුළුණු 10 ක් සඳහා රු.200,000 ක් අයකර නොතිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.52,833 ක් හා මුද්දර ගාස්තු රු.228,922 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් රු.48,000 ක් වැයකර 2017 සැප්තැම්බර් මාසයේ දී ඇඟිලි සළකුණු යන්ත්‍රයක් ආයතනය තුළ ස්ථාපිත කල ද, 2018 ජූලි 10 දින වන විටත් ඒ මඟින් පැමිණීම සහ පිටවීම සළකුණු කර නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 21 කින් වාහන 13 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු කැබ් රථයක් අලුත්වැඩියා කටයුතු සඳහා 2014 ජූලි 19 දින සිට අඹතැන්න යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයට භාර දී තිබුණ ද , එය අලුත්වැඩියා කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට පවතින ලංකා විදුබල මණ්ඩලයට ගෙවිය යුතු රු.93,480 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ දී ඉටුකරන ලද ව්‍යාපෘති ඉටුකිරීම සඳහා සිමෙන්ති හා තීන්ත මිළදී ගැනීමේ දී වැඩිපුර ගෙවන ලද රු.107,812 ක් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත 2010 වර්ෂයේ සිට ගෙවීමට ඇති රු.268,232 ක් 2018 ජූලි 10 දින වන විටත් ගෙවා නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 03 ක පුරප්පාඩු පැවතිණි.

(ආ) සභාවේ සේවය කර ස්ථාන මාරු වීම් ලැබූ සේවකයන් දෙදෙනකුගෙන් 2013 වර්ෂයේ සිට අයවිය යුතු රු.13,960 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි.

(ඇ) සභාවේ සේවය කරන නිලධාරියෙකු සඳහා 2017 පෙබරවාරි 13 දින ලබාදුන් රු.140,000 ක ආපදා ණය හා ඊට අදාල පොළිය 2018 ජූලි 10 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ධාවන මට්ටමේ පවතින ට්‍රැක්ටර් රථ 02 ක මයිලෝ මීටරය ක්‍රියා විරහිත තත්ත්වයක පවතින අතර, එය අළුත්වැඩියා නොකර ඉන්ධන සපයා ධාවනය කර තිබුණි.

(ආ) සභාව සතු වෙළෙඳ සංකීර්ණ වල පැවති කඩ කාමර 05 ක් බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

පලාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ලබාදී තිබූ බවුසරයක හා ට්‍රේලරයක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොතිබුණි.

### 3.4.2 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම

සභාව සතු වාහන 21කින් වාහන 09 ක් අලුත්වැඩියා කළ යුතු තත්වයේ පැවතිය ද එම වාහන අලුත්වැඩියා කර භාවිතා නොකොට සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

### 3.4.3 පවරානොගත් වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව පරිහරණය කරන වාහන 10 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් භාවිතයට ගනු ලබන මුළු වපසරිය අක්කර 04, රූඩ් 02 පර්චස් 23 ක් වූ ඉඩම් 05 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අක්කර 02 යි, රූඩ් 01, පර්චස් 26.7 වපසරියකින් යුත් පැරණි සභා ගොඩනැගිල්ල පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

## 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 01 සිට සියයට 63 දක්වා පරාසයක විචලනයන් පැවති බැවින්, අයවැය ලේඛනය සඵල කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| | **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | - | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීනව නොපැවැත්වීම |
| (ආ) | වත්කම් හා දේපල | - | (i) ලේඛනගත නොකිරීම<br>(ii) ආරක්ෂාව තහවුරු නොකිරීම |
| (ඇ) | තොග | - | (i) ලේඛනගත නොකිරීම<br>(ii) අවිධිමත් තොග පාලනය |
| (ඈ) | ණයගැති හා ණයහිමි | - | (i) උපලේඛන පිළියෙල නොකිරීම<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම |
| (ඉ) | සේවක කළමණාකරණය | - | පූරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම |
| (එ) | ව්‍යාපෘතිය හා කොන්ත්‍රාත් | - | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම |